# මුදල් අමාත්‍යාංශය
# நிதி அமைச்சு
# MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: (94)-11-2484500, (94)-11-2484600, (94)-11-2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11-2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: TIP/SS/01/03
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2019.07. 08

**වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක : 1/2018 (3)**

ජනාධිපති ලේකම්
අග්‍රාමාත්‍ය ලේකම්
අමාත්‍ය මණ්ඩල ලේකම්
අමාත්‍යාංශ ලේකම්වරුන්
කොමිෂන් සභා ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්

**<u>සහනදායි පදනම මත මෝටර් රථ බලපත්‍ර ලබා දීමේ යෝජනා ක්‍රමය</u>**

සහනදායි පදනම මත මෝටර් රථ බලපත්‍ර ලබාදීමට අදාල අංක 01/2018 (1) සහ 01/2018 (2) දරන චක්‍රලේඛ මගින් සංශෝධිත අංක 01/2018 දරන වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 2.6, 8.2 සහ 8.2.ii වගන්ති පහත පරිදි තව දුරටත් සංශෝධනය කරනු ලැබේ.

**01. 2.6. වගන්තියට පහලින් "2.6.1" වශයෙන් පහත වගන්තිය ඇතුලත් කරනු ලැබේ.**

"2.6.1 2015.11.21 දින හෝ එදිනෙන් පසුව ක්‍රියාත්මකව පැවති කුමන හෝ සහනදායී මෝටර් රථ බලපත්‍ර යෝජනා ක්‍රමයක් යටතේ නිකුත් කල බලපත්‍රයක් මගින් මෝටර් රථයක් ලබාගෙන ඇත්නම් එකී බලපත්‍රය නිකුත් කිරීම සඳහා බලය ලබා දී ඇති ආයතනයේ බලධරයා විසින් එම බලපත්‍රයට අදාල අයදුම් පත්‍රය අනුමත කල දින සිට වසර පහක (05) ක සක්‍රිය සේවා කාලයක් ඉක්මවා නොමැති නිලධාරීන් ".

**02. 08.02.ii වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත වගන්තිය ඇතුලත් කරනු ලැබේ.**

"08.02.ii පළමු වරට නොවන වාරයකදී බලපත්‍රය සඳහා ඉල්ලුම් කිරීමේදි

(අ). 2015.11.20 දින හෝ එදිනට පෙර නිකුත් කල බලපත්‍රයක් මගින් ලබා ගත් මෝටර් රථය සඳහා විවෘත කරනු ලැබූ ණයවර ලිපියේ ඡායා පිටපත / දේශීයව එකලස් කරනු ලබන වාහනයක් නම් එය මිල දී ගැනීම සඳහා මුල් වාරිකය ගෙවූ රිසිට් පතෙහි ඡායා පිටපත,

(ආ). 2015.11.21 දින හෝ එදිනෙන් පසුව නිකුත් කල බලපත්‍රයක් මගින් මෝටර් රථයක් ලබා ගත් නිලධාරියෙකු, එම බලපත්‍රය සඳහා ඉදිරිපත් කල අයදුම්පත්‍රයට ඉහත "2.6.1" හි සඳහන් කර ඇති "බලධාරියා" විසින් අනුමැතිය ලබා දී ඇති දිනය පිලිබඳ ආයතන ප්‍රධානියා විසින් සහතික කර නිකුත් කරනු ලබන සහතිකයක් හෝ අයදුම්පතෙහි අදාල කොටසේ ආයතන ප්‍රධානියා විසින් සහතික කරන ලද ඡායා පිටපතක් ".

03. **"8.2.vi"** වශයෙන් පහත වගන්තිය ඇතුලත් කරනු ලැබේ.

"8.2.vi. ඉහත පරිදි ඉදිරිපත් කරනු ලබන අයදුම් පත්‍රය බලපත්‍රය නිකුත් කිරීම සඳහා බලය ලබා දී ඇති ආයතනයේ බලධාරියා අනුමත කිරීමෙන් පසුව එහි ඡායා පිටපතක් අදාල නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුවට ඇතුලත් කල යුතුය".

04. 2018.02.15 දිනැති අංක 01/2018 දරන වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛයේ සහ එහි සංශෝධිත චක්‍රලේඛයන්හි සඳහන් අනෙකුත් සියළු විධිවිධාන නොවෙනස්ව පවතී.

ආර්.එච්.එස්. සමරතුංග
මහා භාණ්ඩාගාරයේ ලේකම් හා මුදල් අමාත්‍යාංශයේ ලේකම්

පිටපත් :

| | | |
|---|---|---|
| 01. | විගණකාධිපති | - අ.ක.ස |
| 02. | මහ බැංකුවේ අධිපති | - අ.ක.ස |
| 03. | අධ්‍යක්ෂ ජනරාල්, වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති | - ඉහත පරිදි කටයුතු කිරීම සඳහා |
| 04. | අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති | - අ.ක.ස |
| 05. | අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා රේගුව | - අ.ක.ස |
| 06. | අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ සේවා | - අ.ක.ස |
| 07. | අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ව්‍යාපාර | - අ.ක.ස |
| 08. | කොමසාරිස් ජනරාල්, මෝටර් රථ ප්‍රවාහන | - අ.ක.ස |
| 09. | කොමසාරිස් ජනරාල්, දේශීය ආදායම් | - අ.ක.ස. |
| 10. | අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ විගණන | - අ.ක.ස. |